


# කුණ්ඩුමනී

"ගී සඳලුව" අපි පටන් ගන්නෙ 2005 අවුරුද්දෙ සැප්තැම්බර් මාසෙ. මේ වෙනකොට ලිපියට අවුරුදු තුනක් සම්පූර්ණයි. මේ විදිහෙ ලිපියක් කරමුය කියලා අදහස දුන්නෙ ජගත් ජේ එදිරිසිංහ සොයුරා. පුද්ගල රූප අඳින්න උපදෙස් දුන්නෙත් ජගත්. ඇඳලා දුන්න චිත්‍ර සටහනක් උපයෝගී කරගෙන ලාංඡනය සැලසුම් කරලා දුන්නේ රොෂානි ඕපනායක සොයුරිය.

ගීතයක වටපිටාව ගැන කතා කරන්න, ඇයි ඒ නිර්මාණය ඒ විදියට කළේ කියලා කියන්න නිර්මාණයක් කරපු, ඒ වගේම නිර්මාණයකට ශිල්පීය දායකත්වය දුන්න අය කැමතියි. ඒ තමන්ගෙ අත්දැකීම් බෙදා ගන්න. ඒ වගේම ඒ තොරතුරු දැනගන්න රසිකයොත් පාඨකයොත් කැමතිය. පසුගිය දා විජිත අමරසේකර ශිල්පියාගේ මෙහෙයවීමෙන් "බෙලාසම්ස්" වාදක වෘන්දයෝ දහ අටවෙනි වසර පිරීම සැමරීමට එකතුවුණා. සනත් නන්දසිරි ප්‍රවීන සංගීතවේදියාණන් හැම සින්දුවක්ම වාගෙ පසුබිම, තමන්ගේ අත්දැකීම විස්තර කළා. එතුමා කියන විදියට ඒක රසවින්දනයට උදව්වක්. ඒ බව සිනාවෙන් අත්පොළසන් හඬින් පිරුණු ප්‍රේක්ෂකාගාරය සනාථ කළා. ඇත්තටම ඒක සුන්දර සින්දුවක් වුණා.

"සන්නස" පත්තරයේ හැම දෙයක් ම වාගේ "ගී සඳළුව"ත් පටන් ගත්තෙ හදිස්සියෙන්. ජගත් එකපාරටම මෙහෙම දෙයක් ඕනෙ කිව්වම ඒ කියන දිනයට දෙනන් අපට කලා කරුවෙක් එක්ක කතා කරන්න ඉඩක් තිබුණෙ නෑ. ඉතින් ගීතනාත් කුඩලිගම සොයුරාගේ අවසරය උඩ වික්ටර් රත්නායකයන්ගේ ජීවන තොරතුරක් ඇතුලත් "මාරුතයේ මියුරු සර" පොතෙන් උපුටා ගත්ත තොරතුරුක් ගැනයි මුලින්ම ලියන්න වුණේ. ඒ තනි තරුවේ ගීත ප්‍රස්තූතය; නැත්නම් හේතු වූ කාරණාව ගැනයි. හතරවන අවුරුද්දේ "ගී සඳළුව" වෙනුවෙන් වික්ටර් රත්නායක සංගීත වේදියාණන් දුරකථනයෙන් සම්බන්ධ කරගන්න අපිට පුළුවන් වුණා.

වික්ටර් රත්නායකයන් තමන්ම තනු නිර්මාණය කරගෙන තමන්ම ගායනා කළ වගේම අනුන්ට තනු නිර්මාණය කරලා දුන්නෙත් සිය ගණනින්. ඒ නිර්මාණවල නැවුම් බවක් තිබුණා. නිර්මාණාත්මක බවක් ප්‍රෙඩී සිල්වා ගායන ශිල්පියා ගායනය කරපු "කුණ්ඩුමනී" සින්දුව රත්නායකයන්ගේ තනු සහ සංගීත නිර්මාණයක් කියලා හිතන්න පුළුවන්ද? අපි රත්නායකයන්ගෙන් ඇහුවා ඒ ගැන.

"මං හිතන්නෙ මේ ගීතය කෙරුණෙ 1975 දි විතර ජී.එස්.බී. රාණිගෙ ගුවන් විදුලි වැඩසටහනකට ඒ කාලයේ ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ජනරාල් රිජ්වේ තිලකරත්න මහත්තයා හොඳ වැඩ ටිකක් කළා."

ඒ දවස්වල මං ඉගැන්නුවෙ නාවල දියවන්නාව විද්‍යාලයේ. පදිංචිවෙලා හිටියෙ ගල්පොත්ත පාරේ. දවසක් හැන්දෑවක ප්‍රෙඩී, ප්‍රේම්වත් එයාගේ ස්කූටරයේ පස්සෙන් තියාගෙන ආව අපේ ගෙදර.

රංගනයෙන්, ගායනයෙන් හැමෝවම සිනාවෙන් නාවපු ප්‍රෙඩී සිල්වා ගායන ශිල්පියානන් ගැන දිගටම ලියන්න ඕන නෑනෙ.

රත්නායකයන් "ප්‍රේම්" කියලා අඳුන්වන්නේ ප්‍රෙමකීර්තිද අල්විස් ප්‍රවීන ගේය පද රචකයාණන් ව.

"ප්‍රේම් කාලයක් ගුවන්විදුලියේ කොකුවිල් වල වැඩ කළානේ. ඒ කාලයේ පරිසරය මූලාශ්‍ර කරගෙන තමයි මේ පදටික ලියලා තියෙන්නෙ. "කොකුවිල් ප්‍රදේශයේ බහුතරය ද්‍රවිඩ ජනතාවයි.

"පද ටික දැක්කම මට හිතුණා කර්ණාටක සංගීතයෙන් යමක් කෙරුණොත් හොඳයි කියලා. භාරතයේ කර්ණාටක සංගීතයේ බොහොම ජනප්‍රිය රාගයක් තියෙනවා "මෝහනම්" කියලා. ඒ රාගය ඇසුරින් තමයි මේ තනුව නව නිර්මාණයක් විදියට කෙරුණෙ. ඇත්තටම උත්තර භාරතයේ හින්දුස්ථානි සංගීතයේ තියෙන "භූපාලි" රාගය වගේමයි "මෝහනම්" රාගය. ඒත් ගායනා කරන විදිය වෙනස්. දන්නවානෙ කෝවිල් වල එහෙම ගායනා කරන විදිය ? ඒ ගතිය ගන්න ඕන නිසයි මම "භූපාලි" රාගය නැතිව "මෝහනම්" තෝරගත්තේ."

**"පද ටික දැක්කම මට හිතුණා කර්ණාටක සංගීතයෙන් යමක් කෙරුණොත් හොඳයි කියලා. භාරතයේ කර්ණාටක සංගීතයේ බොහොම ජනප්‍රිය රාගයක් තියෙනවා "මෝහනම්" කියලා. ඒ රාගය ඇසුරින් තමයි මේ තනුව නව නිර්මාණයක් විදියට කෙරුණෙ. ඇත්තටම උත්තර භාරතයේ හින්දුස්ථානි සංගීතයේ තියෙන "භූපාලි" රාගය වගේමයි "මෝහනම්" රාගය. ඒත් ගායනා කරන විදිය වෙනස්. දන්නවානෙ කෝවිල් වල එහෙම ගායනා කරන විදිය ? ඒ ගතිය ගන්න ඕන නිසයි මම "භූපාලි" රාගය නැතිව "මෝහනම්" තෝරගත්තේ."**

**මන්නාරම් පිටි වැල්ලේ**
**මදටිය වැල් ඔන්චිල්ලේ**
**කොන්ඩෙ කඩන් හඳට හඬන්**
**සින්දු කියන්නී - කුණ්ඩුමනී**

**නැහැයෙ කරාබුව දෙකනේ කඩුක්කන් දමා සියොළඟ**
**මොට්ටැක්කිලියෙන් හැඩකොට වඩා ඉඟනවා**
**කොම්බු ගනං මෘදංග නද මුළු ගමටම හඬවා දීලා**
**කුණ්ඩුමනී**

**සෙම්බු තාලි උකුලෙ හොවා ආඬි ළිඳෙන් දිය ඇදලා**
**ලූනු පාත්තියට දමා විඩාපත් වෙලා**
**උළුඳු කොටා තල වේලා තල් බඩ මද අව්වේ වේලා**
**කුණ්ඩුමනී**
**සණ්ඩුකරලා බැණුම් අහල හැංගි හැංගි බැන්ද ප්‍රේමෙ**
**මහරාජා ආ කළ ගෙට තිරික්කලෙන් බැහැලෑ**
**කුණ්ඩුමනී යන පෙරහැර බලා ඉඳිම් කීකරු වීලා**
**කුණ්ඩුමනී**

"සංගීතයටත් මෘදංගය, තවිල් කියන බෙර යොදාගත්තේ ඒ ගතිය තවත් ඉස්මතු කරගන්න. "නාද සොරම්" කියන භාණ්ඩයත් වයලින් එකත් එක්ක ගලපලා ගත්තා. "නාද සොරම්" භාණ්ඩයත් කෝවිල්වල වාදනය කරන භාණ්ඩයක්.

සුනිල් ආරියරත්නයන් අධ්‍යක්ෂණය කළ "සරුංගලය" චිත්‍රපටයේ අබේවර්ධන බාලසූරියත් නෙරංජලා සරෝජිනියත් ගායනා කරපු "ඉසුරු දෙව්ඳු උමයංගන සේ පෑහෙන්නයි" ගීතයට රත්නායකයන් තනුව, සංගීතය නිර්මාණය කර තිබුණ අන්දම මෙහිදී මතක් වෙනවා. පදරචනය කළේ තිලකරත්න කුරුවිට බණ්ඩාරයන්.

"ඉතින් මම ප්‍රෙඩීට එදා සින්දුව පුරුදු කළා. ප්‍රෙඩිත් හොඳට අල්ලා ගත්තා. ප්‍රෙඩි ආපහු ගියා. ප්‍රේම් එදා අපේ ගෙදර නැවතුණා. දන්නෙ නැද්ද; හවස් වෙලා අපි ඉතින් මධු පානය එහෙම ටිකක් කරන ගමන් කතා කර කර උන්නා. ප්‍රේම් මට කියනවා, "අනේ මචං, මේක උඹ කියපං. මං ප්‍රෙඩීට වෙන හොඳ එකක් ලියලා දෙන්නං. මේකේ ඉතින් උගේ අනික් සින්දු වගේ උපහාසයකුත් නෑනේ. ඌට හරියන්නෙ ඒවා."

"කෙනෙකුට හදලා, පුරුදු කරපු එකක් මං කොහොමද කියන්නෙ? කීයටවත් මං නම් කරන දෙයක් නෙවෙයි. අනික ප්‍රෙඩී සිංදුව හොඳට ගායනා කළා. "රත්නායකයන් තමන්ගේ කතාව නිමකළා. "සන්නස" වෙනුවෙන් අපේ ස්තූතිය පිරි නැමුණා.

ප්‍රේමකීර්ති ද අල්විස්, වික්ටර් රත්නායක, ප්‍රෙඩී සිල්වා යන කලා කරුවන් තුන්දෙනා එකතුවෙලා කරපු උපහාසය මුහුවණ ගීත පෙළක්ම තියෙනවා.

ද්‍රවිඩ ජන සමාජය දිහා දයාවෙන්, ආදරයෙන් බලපු ගීත රචනා පෙළක මුල්ම ගීතයයි "කුණ්ඩුමනී". සම කාලීනව මහාචාර්ය සුනිල් ආරියරත්නයන් වික්ටර් රත්නායකයන් හා නෙරංජලා සරෝජිනිය වෙනුවෙන් "මීන නුවන් යුගින් බලන් මීනා" ගීතය ලිව්වා. එහි තනුව හා සංගීත නිර්මාණයක් සිංහල ද්‍රවිඩ සංගීත රටා මුහු කරගෙන නිර්මාණය වූවක්. අප අතරින වියෝ වූ ප්‍රෙඩී සිල්වා සහ ප්‍රේමකීර්ති ද අල්විස් කලාකරුවන්ව ආදරයෙන් සිහිපත් කරමින් මෙවර ගී සඳළුව නිමාව දකිනවා.



සිසිර දිසානායක

